ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2013 දෙසැම්බර් 03 වැනි දින |

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2009 වසරේ සමීපස්ථ ණය පහසුකම් යටතේ කරන ලද පසු වැඩසටහන් අධීක්ෂණ සාකච්ඡාව සාර්ථකව නිම කරයි.**

පශ්චාත් සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන් අධීක්ෂණය (PPM) සහ පූර්ව සහ පසු ඇගයීම් (EPE) පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මාණ්ඩලික වාර්තාව 2013 නොවැම්බර් 27 දින සමාලෝචනයෙන් අනතුරුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ උද්ධමනය තනි ඉලක්කමක මට්ටමේ පවත්වා ගනිමින් ආර්ථිකය ශක්තිමත් වර්ධනයක් වාර්තා කිරීම පිළිබඳව යහපත් අයුරින් පිළිගත් බව ශ්‍රී ලංකා බලධාරීන් සතුටින් සඳහන් කරයි. මෑතකාලීනව ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තුළ පැවති ඉහළ උච්චාවචනයන් මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය පෙන්නුම් කළ ශක්තිමත් භාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පැසසුමට ලක් කර ඇත. තවද, බාහිර පරිසරයේ අභියෝග පැවතිය ද ජංගම ගිණුමේ හිඟය අඩුවීම සහ ජාත්‍යන්තර සංචිත ඉහළ යාම සමඟ 2013 වසරේ දී විදේශීය අංශයේ සිදු වූ සැලකිය යුතු වර්ධනය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවධානයට ලක්විය. ශ්‍රී ලංකා බලධාරීන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි මැදිහත්වීම් සීමාකරමින් වර්තමානයේ නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ ප්‍රශංසාව හිමි වූ අතර, 2013 සැප්තැම්බර් අග වන විට නිල විදේශ සංචිත ආනයනික මාස 4.4 කට සමාන වන පරිදි එක්සත් ජනපද ඩොලර් බිලියන 7.0 ක් දක්වා වර්ධනය වීමත් සමඟ, ඇති විය හැකි කම්පනයන්ට මුහුණ දිය හැකි පරිදි තවදුරටත් විදේශීය අංශය ශක්තිමත් කිරීමේ වැදගත්කම ද අවධාරණය කරන ලදී.

ඒ සමඟම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2009 වසරේ සිට අයවැය හිඟය තිරසාර ලෙස අඩු කර ගැනීම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා රජයේ ඇති දැඩි කැපවීම පිළිගෙන ඇති අතර, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායමෙහි අඩුවීම අවධානයට යොමු විය යුතු කාරණයක් ලෙස ඉස්මතුකොට ඇත. කෙසේ වුවද, ශ්‍රී ලාංකීය බලධාරීන් විසින් 2013 වසර සඳහා අය වැය හිඟයෙහි ඉලක්කය වන 5.8 ක ප්‍රතිශතය ළඟාකර ගත හැකි බව ප්‍රකාශ කර ඇති අතර, එනිසා මේ සම්බන්ධයෙන් වන අසමතුලිතතාවක් පැනනැගීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. මැදිකාලීනව එවැනි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් උදෙසා 2014 අයවැය මඟින් ද බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය සහ අනුකූලතාවය වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කර ඇත. එසේම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මූල්‍ය ක්‍රියාකාරිත්වයෙහි අත්කර ගෙන තිබෙන ඉහළ ප්‍රගතිය මඟින් ආර්ථිකය වඩා තිරසාර වූ මාවතකට යොමු වී ඇතැයි යන්න ශ්‍රී ලාංකීය බලධාරීන්ගේ මතය වී ඇත.

සමස්තයක් ලෙස සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන මඟින් බලාපොරොත්තු වූ පරිදි කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මෙන්ම පසු ඇගයීම මඟින් සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන සාර්ථක ලෙස නිම කර ඇති බව සහ සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් වී ඇති බව පිළිගැනීම, බලධාරීන්ගේ සැලකිල්ලට යොමු විය. වර්තමාන මුදල් ප්‍රතිපත්තිය යෝග්‍ය බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක කමිටුව දක්වා ඇති අතර, උකස් අංශයෙහි පවතින අක්‍රීය ණය පිළිබිඹු කරමින් සමස්ත අක්‍රීය ණය අනුපාතය සුළු වශයෙන් ඉහළ ගිය ද මූල්‍ය පද්ධතිය තවදුරටත් ශක්තිමත් සහ හිතකර මට්ටමක පවතින බව සඳහන් කොට ඇත.

කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කළ ඇතැම් පුරෝකථනයන් අතාත්වික බවක් දැකිය හැකි බව ශ්‍රී ලාංකීය බලධාරීන්ගේ අදහසයි. 2013 තෙවන කාර්තුව තුළ දී ආර්ථික වර්ධනය කඩිනම් වීමත්, 2013 ඔක්තෝබර් මාසය තුළ අපනයනයන්ගේ සැලකිය යුතු වර්ධනයක් වාර්තාවීමත් සැලකිල්ලට ගැනීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වර්ධන පුරෝකථනයන් අනවශ්‍ය ලෙස සර්ව අසුභවාදී බව පෙන්නුම් කරයි. එසේම ඉහළ ගිය අපනයන ක්‍රියාකාරිත්වයත් සමඟ ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වනු ඇත. එමෙන්ම උද්ධමනයේ ඇති වූ මෑතකාලීන ශීඝ්‍ර පහළ යාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇස්තමේන්තු සඳහා සැලකිල්ලට ගෙන නොමැති බව ද පැහැදිලි කරුණකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය සහ කාලපරිච්ඡේදය අවසානයේ මතුපිට උද්ධමනය මෙන්ම මූලික උද්ධමනය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනයන්ට

වඩා පහළ අගයක් ගනු ඇති අතර, 2013 සාමාන්‍ය මතුපිට උද්ධමනය සඳහා වඩාත් සුදුසු පුරෝකථනය සියයට 6.9 ක් ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය පිළිවෙළින් සියයට 5.2 කට සහ සියයට 2.1 කට ආසන්න අගයක් ද වනු ඇත.

2013 වසර සඳහා දැනට පවත්නා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනයන් සහ ශ්‍රී ලාංකීය බලධාරීන්ගේ පුරෝකථනයන් අතර සංසන්දනයක් පහත දැක්වේ.

**ශ්‍රී ලංකාව : තෝරාගත් ආර්ථික දර්ශක**

| | 2013 | |
|---|---|---|
| | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථන | ශ්‍රී ලාංකීය බලධාරීන්ගේ පුරෝකථන |
| **ද.දේ.නි. සහ උද්ධමනය (ප්‍රතිශතයක් ලෙස)** | | |
| මූර්ත ද.දේ.නි.යේ වර්ධනය | 6.5 | 7.2 |
| උද්ධමනය (සාමාන්‍ය) | 7.2 | 6.9 |
| උද්ධමනය (කාලපරිච්ඡේදය අවසානයේ දී) | 7.0 | 5.2 |
| මූලික උද්ධමනය (කාලපරිච්ඡේදය අවසානයේ දී) | 6.1 | 2.1 |
| **රාජ්‍ය මූල්‍ය (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)** | | |
| ආදායම | 12.5 | 13.6 |
| ප්‍රදාන | 0.2 | 0.2 |
| වියදම | 18.5 | 19.7 |
| මධ්‍යම රජයේ ශේෂය | -5.8 | -5.8 |
| මධ්‍යම රජයේ දේශීය මූල්‍යයනය | 4.4 | 3.5 |
| රාජ්‍ය ණය (දේශීය සහ විදේශීය) | 76.6 | 76.0 |
| **මුදල් සහ ණය (කාලපරිච්ඡේදය අවසානයේ දී ප්‍රතිශතය)** | | |
| සංචිත මුදල් | -3.3 | 3.2 |
| පුළුල් මුදල් | 13.1 | 16.0 |
| දේශීය ණය | 17.0 | 12.3 |
| පෞද්ගලික අංශයේ ණය | 17.0 | 8.7 |
| රාජ්‍ය අංශයේ ණය | 17.0 | 18.7 |
| **ගෙවුම් තුලනය (එ.ජ.ඩොලර් මිලියන)** | | |
| අපනයන | 9,826 | 10,278 |
| ආනයන | 19,406 | 19,046 |
| ජංගම ගිණුමේ ශේෂය | -3,384 | -2,714 |
| ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස) | -5.2 | -4.0 |
| අපනයන වටිනාකමේ වර්ධනය (ප්‍රතිශතයක් ලෙස) | 0.5 | 5.2 |
| ආනයන වටිනාකමේ වර්ධනය (ප්‍රතිශතයක් ලෙස) | 1.2 | -0.7 |
| **දළ නිල සංචිත (කාලපරිච්ඡේදය අවසානයේ දී)** | | |
| එ.ජ.ඩොලර් මිලියන | 6,661 | 7,129 |
| ආනයනික මාස වශයෙන් | 3.2 | 4.5 |